# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2178/3 - 2020 ජුනි මස 01 වැනි සඳුදා - 2020.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/KUN/04/07/16/04/74.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/136.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 714 දරන අහස්පොකුණ උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අතරගල්ල පල්ලෙගම්මැද්ද ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද, 2020.01.29 වැනි දිනැති අංක මහ 6957 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1 වශයෙන් දැක්වෙන, අහස්පොකුණ වත්ත නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණය හෙක්ටයාර් 0.0506 (පර්චස් 20) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

කැබලි අංක 1

ඉඩමේ නම: අහස්පොකුණ වත්ත; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනය: ලියනගේ රාලලාගේ සුමනා සොනාලි රාජපක්ෂ මහත්මිය, අංක 192/9ඒ, මාකන්දන, මඩපාත, පිළියන්දල; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0506 (පර්චස් 20).

*ඉඩමේ මායිම්:*

*උතුරට*: මූලික පිඹුරු අංක මහ 2661 කැබලි අංක 26 සහ 21; *නැගෙනහිරට*: මූලික පිඹුරු අංක මහ 2661 හි කැබලි අංක 21 සහ මූලික පිඹුරු අංක මහ 2355 හි කැබලි අංක 3; *දකුණට*: මූලික පිඹුරු අංක මහ 2355 හි කැබලි අංක 3 සහ මූලික පිඹුරු අංක මහ 2661 හි කැබලි අංක 26; *බටහිරට* : මූලික පිඹුරු අංක මහ 2661 කැබලි අංක 26;

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින්, බලය ලත් අයවලුන් හෝ 2020 මැයි මස 13 වැනි දින පෙ.ව. 10.00 ට කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020 මැයිමස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගතකළ හැක.

ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

සමන්ති ඩී. නාගහතැන්න,
ප්‍රාදේශීය ලේකම්,
කුණ්ඩසාලේ.

2020 මාර්තු මස 10 වැනි දින,
මැණික්හින්න,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-85

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KOT/LND/ACQVI/01/78.

*ඉඩම් අමාත්‍යංශයේ යොමු අංකය* : 4-3/4/2018/D/79.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්ති යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විහාරහේන ග්‍රාම නිලධාරී වසමේ මතුගොබේ (දැනට දෙනියාය) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 169 හි පත්‍ර 117 හි අතිරේක අංක 135 හි කැබලි අංක 1516 සහ 1517 වශයෙන් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.0174 ක් වූ එනසල්වත්ත නමැති ඉඩම් කැබලිවලට මායිම්.

**කැබලි අංක 1516**

ඉඩමේ නම: එනසල්වත්ත; හිමිකම් කියන්නා: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 1.6249.

*ඉඩමේ මායිම්:*

*උතුරට*: කැබලි අංක 1352; *නැගෙනහිරට*: කැබලි අංක 1352 හා 1351; *දකුණට*: කැබලි 1351 සහ 1352; *බස්නාහිරට*: කැබලි අංක 1352;

**කැබලි අංක 1517**

ඉඩමේ නම: එනසල්වත්ත; හිමිකම් කියන්නා: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 1.3925.

*ඉඩමේ මායිම්:*

*උතුරට*: කැබලි අංක 1351 සහ 1350; *නැගෙනහිරට*: කැබලි අංක 1350 සහ 177; *දකුණට*: කැබලි අංක 1350, 177 සහ මාර්ග (මා.සං.අ); *බස්නාහිරට*: කැබලි අංක 1350 සහ 1351;

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් ඇති සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින්, බලයලත් අයවලුන් හෝ 2020.08.04 වැනි දින පෙ.ව. 10.00 ට කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020.07.28 වැනි දිනට මත්තෙන් ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2020 මාර්තු මස 12 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-89

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.